

# අර්බුදය ජයගත් දෙවසර

අසාර්ථක පාලනයක් හමුවේ බිඳ වැටුණු රට
අරගල භූමියක් බවට පත්ව තිබියදී, රට
අරාජිකත්වයට පත්වීමට ඉඩ නොදී අර්බුදය
ජයගෙන රට ස්ථාවර හා සුරක්ෂිත කිරීමට
නොබියව ඉදිරිපත් වූ රනිල් වික්‍රමසිංහයන්
සිය දෙවසරක පාලන කාලය තුළ රටෙහි
ප්‍රගමනය හා ස්ථාවරත්වය වෙනුවෙන්
ඉටු කරන ලද කාර්ය භාර්යය

2022 මැද භාගයේ රටෙහි මතුවූ දැඩි අර්බුදකාරී වාතාවරණය හමුවේ රට බංකොලොත්භාවයට පත්වෙමින් තිබියදී රට පුරා සිදුවූ මහජන නැගිටීම් හා ජන අරගල හේතුවෙන් රට අස්ථාවරත්වයට පත්විය.

පැවති මහජන විරෝධතාවන් හේතුවෙන් එවක පාලකයන් සිය තනතුරු අත්හැර යද්දී රටේ හා මහජනතාවගේ ආරක්ෂාව හා ස්ථාවරත්වය වෙනුවෙන් රට ගොඩනැගීමේ වගකීම නොබියව භාරගත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ ගෙවුණු වසර දෙකක කෙටි කාලයක් තුළ රට ආර්ථික අර්බුදයෙන් හා බංකොලොත්භාවයෙන් මුදාගෙන ස්ථාවර කිරීමට කටයුතු කරන ලදි.

එහිදී, සිය දෙවසරක පාලන කාලය තුළ වැටී තිබුණු රට නැවත ගොඩගෙන ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කිරීමටත්, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කොට ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත්කිරීමටත් ක්‍රියාත්මක කළ ආර්ථික දේශපාලන හා සමාජීය කාර්ය භාර්යයෙහි සාරාංශගත කරුණු පෙළගැස්මක් ලෙස මෙය ඉදිරිපත්කොට ඇත.

## ආර්ථික ප්‍රතිපත්ති හා තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම හා එහි ප්‍රතිඵල

- සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීම සඳහා සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කිරීම
- ශ්‍රී ලාංකීය විදේශගත වෘත්තිකයින් එවනු ලබන ප්‍රේෂණ බැංකු පද්ධතිය හරහා ලංකාවට එවීම සඳහා දිරිමත් කරලීමට පියවර ගැනීම
- කර්මාන්ත හා අපනයන අංශයන්ට එල්ල වී ඇති බාධාවන් ඉවත් කිරීම
- රටේ අපනයන ආදායම සහ විදේශ ප්‍රේෂණයන්ට සරිලන පරිදි ඉන්ධන ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම
- හිංසනය ප්‍රචණ්ඩත්වය හා අනෙකුත් වෙනස්කම් වලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය සමාජ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා සියලු දෙනාගේම සහයෝගයෙන් පියවර ගැනීම
- අරගලයට මුවා වී ප්‍රචණ්ඩත්වය පතුරන ලද පුද්ගලයන් සම්බන්ධයෙන් දේශපාලන බලපෑමකින් තොරව එකලෙස නීතිය ක්‍රියාත්මක කිරීම
- දේශපාලන පක්ෂ නායකයන්ගෙන් සමන්විත ජාතික සභාවක් පිහිටුවීම
- ජාති, ආගම්, පක්ෂ, කුල ආදී සියලු භේද තුරන්කර කුසලතාවය හා හැකියාව මත පුද්ගලයෙකුගේ ඉදිරි ගමන තීරණය කිරීමේ පදනම තහවුරු කරලීමට අවශ්‍ය පදනම සැකසීම
- විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික දෙමළ ජනතාව සමග සමීපව කටයුතු කරමින්, ශ්‍රී ලංකාව යළි නගාසිටුවීමේ වැඩපිළිවෙළට ඔවුන්ගේ සහාය ලබා ගැනීම
- “ජාතික සභාව” පිහිටුවීම
- විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීම උදෙසා විදේශ විනිමය රෙගුලාසි යම් ප්‍රමාණයකින් ලිහිල් කිරීම
- තැන්පතු සඳහා පොලී සීමාවන් පැනවීම ඔස්සේ පොලී අනුපාත සීමිත මට්ටමක රඳවා ගැනීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පළමු ගිවිසුමට පැමිණීම
- ඉන්දියාවට, චිනයට, පැරිස් සමාජයට පිළිගත හැකි ණය ප්‍රතිව්‍යුහගතකරණයක් ඉදිරිපත් කිරීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ පරිදි පළමු ණය වාරිකය ලැබීම
- ශ්‍රී ලංකාව තිරසාර මූල්‍යකරණය සඳහා වන මාර්ග සිතියම, හරිත මූල්‍ය වර්ගීකරණය, තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සඳහා වන ආයෝජක සිතියම සකස් කිරීම
- කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයට (RCEP) ඇතුළත් වීම සඳහා මුලපිරීම
- සෞභාග්‍ය සැලැස්මේ සඳහන් ආයෝජන අවස්ථා සාක්ෂාත් කර ගැනීමට කටයුතු කිරීම

- සැපයුම් සඳහා පැවති අවහිරතා සාර්ථකව විසඳා ගැනීම, ආනයන සීමා ඉවත් කිරීම සහ විදේශ විනිමය ද්‍රවශීලතාවය යථා තත්වයට පත් කර ගැනීම
- ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුමට අත්සන් කිරීම
- ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමට අත්සන් තැබීම
- ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය (GJRTI) සහ තායිලන්ත මැණික් හා ස්වර්ණාභරණ ආයතනය (GIT) අතර සහයෝගීතාව වැඩිදියුණු කිරීමේ අවබෝධතා ගිවිසුමකට ඉන් අනතුරුව අත්සන් කිරීම
- දළ දේශීය නිෂ්පාදිතය 2023 තුන්වන කාර්තුවේදී සියයට 1.6ක වර්ධනයක් අත්පත් කර ගැනීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන් පදනම් කර ගනිමින් වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන ආර්ථික කොමිසමක් පිහිටුවීමේ මූලික කටයුතු අවසන් කිරීම
- ලංකාව කලාපීය සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ගොඩබිම් සම්බන්ධතාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයන ආරම්භ කිරීම
- ආර්ථික පරිවර්තනය වෙනුවෙන් පසුගිය කාලය තුළ නව නීති 83ක් පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන ඇත
- පළමු වතාවට ප්‍රාථමික අයවැයෙන් 2023 වසරේ 6.7%ක අතිරික්තයක් ලැබීම
- රාජ්‍ය ආදායම 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 50 කට වැඩි ප්‍රමාණයකින් ඉහළ නංවා ගැනීමට හැකි විය
- 2022 වසරේ පළමු මාස අට තුළ, රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් 52 හි සමස්ත පාඩුව රු. බිලියන 720 ක් වුව ද, 2023 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ එය රු. බිලියන 313 ක ලාභයක් බවට පරිවර්තනය කරගැනීම
- මහ බැංකුව සහ රජය සම්බන්ධීකරණයෙන් සිදු කළ සාර්ව ආර්ථික ඉල්ලුම් කළමනාකරණ ප්‍රයත්නයන් හේතුවෙන් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 70 ක්ව තිබූ උද්ධමනය 2024 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 5.9 දක්වා පහළ වැටීම
- 2023 වසරේ දී සියයට 30 ඉක්ම වූ පොලී අනුපාත සියයට 10 කට වඩා අඩු අගයකට මේ වන විට පහත වැටීම
- 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ට වඩා අඩු අගයක පැවැති, භාවිතා කළ හැකි විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 3 කට වඩා වැඩි අගයකට ඉහළ නැංවීම
- 1977 වසරෙන් පසු ප්‍රථම වතාවට 2023 වසරේ දී ගෙවුම් ශේෂයේ, ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති කර ගැනීමට හැකිවීම
- වර්තමානයේ රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11 කට ආසන්න මට්ටමකට වැඩි කර ගැනීමට හැකිවීම
- සමස්ත බදු ලිපිගොනු ගණන 2023 වසරේ දී මිලියන 1 ට වඩා වැඩි ප්‍රමාණයකට ඉහළ නංවා ගැනීම. මෙය 130% ක ඉහළ යෑමකි
- මුදල් අච්චු ගැසීම සම්පූර්ණයෙන්ම නවතා දැමීම
- රාජ්‍ය මුදල් හා ආර්ථික කළමනාකරණය වැඩි දියුණු කිරීමට හා ඒ සඳහා පහසුකම් සැලසීමට නෛතික රාමුව, පද්ධති හා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සකස් කිරීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකා රජය අතර ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවට පැමිණීම
- ශ්‍රී ලංකා රජය සහ ඉරාන රජය අතර සංස්කෘතික, අධ්‍යාපන, තරුණ කටයුතු, මාධ්‍ය, සංචාරක හා චිත්‍රපට කර්මාන්තය යන ක්ෂේත්‍රවල අවබෝධතා ගිවිසුම් 5කට අත්සන් තැබීම
- උද්ධමනය 1.5% පමණ පහතට ගෙන ඒම
- වසර ගණනාවක් තිස්සේ හිඟයක් ලෙස පැවති ප්‍රාථමික ගිණුමේ ශේෂය, 2023 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 0.6% ක අතිරික්තයක් ලෙස පරිවර්තනය කිරීමට හැකි වීම
- පොළී අනුපාතය 10-13% දක්වා පහළට ගෙන ඒම
- 2024 පළමු මාස තුන වන විට විනිමය අනුපාතය ඇමෙරිකානු ඩොලර් එකක් රු. 300 වඩා අඩු මට්ටමකට ගෙන ඒමට හැකි වීම
- විදේශ විනිමය සංචිත ඩොලර් බිලියන 5 ඉක්මවන අගයකට ඉහළ නැංවීම
- දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය 2023 වසරේදී අවසන් කිරීම

- නිල වශයෙන් ලබා ගන්නා ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අදාළ රටවල් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු 2023 නොවැම්බර් මස වන විට ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය එකඟතාවයක් ඇති කර ගැනීම

- පැරිස් සමාජය (Paris Club) මෙන්ම පැරිස් සමාජයට අයිති නැති චීනය වැනි රටවල් සමඟ ද ප්‍රතිපත්තිමය එකඟතාවයට පැමිණීම

- ණය හිමි රටවල් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා වන කෙටුම්පත පිළිබඳව ශ්‍රී ලංකා රජය නිල ණය හිමියන්ගේ කමිටුව (Official Creditors Committee) සමඟ සාකච්ඡා කිරීම

- චීනයේ EXIM බැංකුව සමඟද මෙම සාකච්ඡාව සිදු කිරීම

- වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරන ලසාඩ් (Lazard) සහ ක්ලිපර්ඩ් චාන්ස් (Clifford Chance) උපදේශක සමාගම් එම ණය හිමියන්ගේ කමිටුව සමඟ සාකච්ඡා පැවැත්වීම

- IMF ආයතනයේ සහයෙන් සිදු කරන ලද රාජ්‍ය පාලන විමර්ශන වාර්තාව (Governance Diagnostic Report) පාදක කර ගෙන දූෂණ විරෝධී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මේ වන විට මුලපුරා ඇති අතර කැබිනට් මණ්ඩලයට එම පනත් කෙටුම්පත ඉදිරිපත් කර ඇත

- අනුගමනය කළ කෘෂිකාර්මික පිළිවෙත් මඟින් 2022 යල කන්නයේත්, 2022/23 මහ කන්නයේත් 2023 යල කන්නයේත්, 2023/24 මහ කන්නයේත් සාර්ථක වී අස්වැන්නක් ලැබීම

- පරාටේ නීතිය සංශෝධනය කර කෙටි කාලයක් තුළ ණය යෝජනා ක්‍රම වෙනුවෙන් සහනයක් ද ලබාදීම

- 2024 වර්ෂය තුළදී (මැයි දක්වා) ලක්ෂ 8කට ආසන්න සංචාරකයන් සංඛ්‍යාවක් ලංකාවට පැමිණීම

- රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ අරමුණු කර ගනිමින් නව නීති හා නීති සංශෝධන 30 කට වැඩි සංඛ්‍යාවක් පසුගිය වසර දෙකක කාලය තුළ පාර්ලිමේන්තුවේ සම්මත කිරීම

- අපනයන ආර්ථිකයක් ඇති කිරීමට අවශ්‍ය නීති කෙටුම්පත් සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම

- ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බලශක්ති සම්බන්ධතාවය පිළිබඳව සාකච්ඡා ආරම්භ කිරීම

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව 2023 දෙසැම්බර් මාසය අවසානය වන සිට සමාජ සුබසාධන වියදම් හැර සියලුම ප්‍රමාණාත්මක ඉලක්ක ශ්‍රී ලංකාව විසින් සපුරා ඇති අතර 2024 අප්‍රේල් මාසය අවසන් වන විට බොහෝ ව්‍යුහාත්මක ඉලක්ක ප්‍රමාදයකින් යුතුව හෝ සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීම

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී විස්තීරණ ණය මුදලේ තෙවන වාරිකය අනුමත වීම

- ශ්‍රී ලංකාව සිය ද්විපාර්ශ්වික ණය හිමියන්ගෙන් සැදුම්ලත් නිල ණයහිමියන්ගේ කමිටුව සමඟ පැරිස්හිදී ඇමරිකානු ඩොලර් බිලියන 5.8 ක ණය මුදලකට අදාළ ප්‍රතිව්‍යුහගත කිරීමේ අවසන් එකඟතාවකට එළැඹීම - (2024-06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)

- ඩොලර් බිලියන 4.2 ක ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සඳහා චීන එක්සිම් බැංකුව සහ ශ්‍රී ලංකාව අතර බීජිං නුවරදී ගිවිසුම් අත්සන් තැබීම - (2024-06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)

- 2022 අගෝස්තු 03 වැනිදා පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ කරමින් සිදු කළ කතාවේදී රටට ඉදිරිපත් කළ ආර්ථිකය යළි ගොඩනැංවීම සඳහා අනුගමනය කරන සිව්වැදෑරුම් සැලැස්මෙහි මුල් කරුණු තුනම සාර්ථක වී ඇත - (2024- 06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ එකඟතාවල පහත සඳහන් ප්‍රතිලාභ ඇතුළත් වේ.

**මූල්‍ය සහන:**

ශ්‍රී ලංකාවේ බදු ආදායම, ණය ගෙවීම් වෙනුවට අත්‍යවශ්‍ය පොදු සේවා සඳහා යොදා ගත හැකි අතර, ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සඳහා කාලය ලබා දෙයි.

**විදේශ මූල්‍යකරණය:**

- ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ද්විපාර්ශ්වික මූල්‍ය පහසුකම් සලසා ගැනීම නැවත ආරම්භ කළ හැකිය. අයවැයේ ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය සහාය සම්බන්ධයෙන් වන කෙටි කාලීන විදේශ මූල්‍ය පහසුකම් සලසා ගැනීම සම්බන්ධයෙන් මෙමගින් සැලකිය යුතු බලපෑමක් සිදුවේ.

- එය ඉදිකිරීම් වැනි අංශ සඳහා ධනාත්මක බලපෑම් ඇති කරන අතර වැදගත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මධ්‍ය කාලීනව සිට දිගු කාලීනව ධනාත්මක බලපෑම් ඇති කරයි.

**ණය ශ්‍රේණිගත කිරීම්:**

- නිල ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ නිගමනය, ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් යථා තත්ත්වයට පත් කිරීමේ වැදගත් පියවරකි. වාණිජ බැඳුම්කර හිමියන්ගේ ණය ද කඩිනමින් ප්‍රතිව්‍යුහගත කළ පසු, එය ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට මග පාදයි. නිල ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ නිගමනය විදේශ මූල්‍ය පහසුකම් සඳහා පහසු ප්‍රවේශය සහ අඩු පිරිවැය යන ආකාරවලින් සැලකිය යුතු ප්‍රතිලාභ ලබා දෙනු ඇතියි. එය වෙළඳ මූල්‍යකරණයේ සිට අන්තර් බැංකු අරමුදල් සලසා ගැනීම දක්වා සියලු අංශ කෙරෙහි බලපායි.

- අඛණ්ඩව කාර්තු 6ක් හැකිලෙමින් තිබූ මෙරට ආර්ථිකය 2023 වසරේ 3 වැනි කාර්තුවේ සිට වර්ධනය වෙමින් ඇති අතර, 2022 අප්‍රේල් වන විට පත්ලටම සිඳී තිබූ මෙරට විදේශ සංචිතය මේ වන විට ඩොලර් මිලියන 5,500ක් දක්වා ඉහළ නැංවී ඇත - (2024-06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)
- මේ වන විට රුපියල ශක්තිමත්ව, බැංකු පොලී අනුපාත අඩුවී, උද්ධමනය ද 0.9%ක් දක්වා පහතට ගෙනැවිත් ඇත. අයවැය ප්‍රාථමික ගිණුමේ ශේෂය අතිරික්තයක් ලෙස පරිවර්තනය කිරීමට හැකිව ඇති අතර 1977න් පසු පළමු වරට, පසුගිය වසරේ මෙරට විදේශ ගිණුම් ශේෂයේ අතිරික්තයක් ඇති කර ගැනීමට සමත් විය - (2024- 06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)
- ඉතිහාසයේ පළමු වතාවට IMF වැඩ සැලැස්මක් සාර්ථක කර ගැනීමට නායකත්වය ලබාදීම - (2024- 06-26 ජනාධිපති විශේෂ ප්‍රකාශය)
- විධායක බලතලවල කොටස් ගණනාවක් පළාත් සභාවලටත්, පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා වෙතත් ලබාදීම
- රාජ්‍ය සේවයේ වැටුප් විෂමතාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම
- 2019 අප්‍රේල් 21 දින සිදුවූ බෝම්බ ප්‍රහාර පිළිබඳ ලැබුණු පූර්ව බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය (SIS), ජාතික බුද්ධි ප්‍රධානී (CNI) සහ අනෙකුත් බලධාරීන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනය කිරීම සඳහා විමර්ශන කමිටුවක් පත් කිරීම
- ගාසා තීරයේ ගැටුම්වලින් විපතට පත්වූවන් වෙනුවෙන් සහන සැලසීම සඳහා "ගාසා හි ළමා අරමුදල (Children of Gaza Fund)" පිහිටුවීම

## පැවති ප්‍රධාන අර්බුද වලට කඩිනම් විසඳුම්

- පොහොර හිඟය විසඳා පොහොර ගෙන්වා ගැනීමේ කටයුතු විධිමත් කිරීම
- ඉන්ධන හා ගෑස් හිඟය සම්පූර්ණයෙන්ම තුරන් කර සාමාන්‍ය පරිදි ගෑස් හා ඉන්දන ලබාදීමට පියවර ගැනීම
- ආහාර හිඟයක් ඇති නොවීම සඳහා වූ ආරක්ෂිත පියවර ගනිමින් ජාතික වැඩසටහන් සම්පාදනය කිරීම
- විදුලි කප්පාදුව අවම කර ගැනීම
- පොහොර සහනාධාරය ලබාදීම
- කෘෂිකර්මාන්තයට අවශ්‍ය බීජ ලබාදීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන ලබාදීම
- ධීවර කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම
- මූලික පාරිභෝගික භාණ්ඩ සඳහා උපරිම මිල සීමාවන් නියම කිරීම
- QR කේතය ඔස්සේ සිදු කළ ඉන්ධන සීමාව ඉවත් කිරීම

## ප්‍රධාන සංවර්ධන කාර්යයන්

- 2022 වර්ෂයේ ඉදිරි කාලය සඳහා අන්තර්කාලීන අයවැය ඉදිරිපත් කිරීම
- සංචාරකයින් වැඩි වැඩියෙන් ගෙන්වාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම
- සෑම රටක් සමගම සුහද හා මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
- සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා වූ ප්‍රතිපාදන වෙන් කිරීම
- මහජනතාව වෙත ලබාදෙන සේවාවන් පහසු කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහාත්, අදාළ ආදායම් කඩිනමින් එක්රැස් කර ගැනීම සඳහා මාර්ග ගත සේවා පහසුකම් ලබාදීම
- පර්යේෂණ හා සංවර්ධන අංශ වැඩිදියුණු කිරීමට පියවර
- රාජ්‍ය අංශයේ තෝරාගත් වෘත්තීය පුහුණු ආයතනවල සේවකයින්ට NVQ සහතික ලබාදීම
- කෘෂිකර්ම නවීකරණ වැඩසටහන ආරම්භ කිරීම
- 2024 දළ දේශීය නිෂ්පාදිතය 9.2%ක ඉලක්කයක් බවට පත්කර ගැනීමට කටයුතු කිරීම
- අස්වැසුමට බිලියන 207ක් වෙන් කිරීම
- වැටුප් වැඩි කිරීම සහ විශ්‍රාම වැටුප් සඳහා තවත් රුපියල් බිලියන 133ක් වෙන් කිරීම
- වසර 03කට පසු දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය ලෙස රුපියල් මිලියන 11,250ක් වෙන් කිරීම
- ගාල්ල සංවර්ධනයට විශේෂ කොමිසමක් පත් කිරීම
- සංචාරක ව්‍යාපාරයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් ලැබීම. ඒ අනුව 2022 රටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 194,495කි. 2023 වසරේ ඒ සංඛ්‍යාව 1,487,303ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වීම. 2024 වසරේ ජනවාරියේදී 200,000කට අධික සංචාරකයන් පිරිසක් පැමිණීම
- ශ්‍රී ලංකාවට පැමිණෙන ඉන්දීය සංචාරකයන් සඳහා QR කේතය මඟින් ඩිජිටල් ක්‍රමවේදය ඔස්සේ ඒකාබද්ධ ගෙවීම් ක්‍රමවේදය හෙවත් UPI හරහා ගෙවීම් කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදීම
- ශ්‍රී ලංකාව සහ මොරිෂස් රාජ්‍යය UPI පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම
- ගාල්ල මෙරට ප්‍රධාන සංචාරක නගරය බවට පත් කිරීම ආරම්භ කිරීම
- කෘෂි නවීකරණ වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කිරීම
- බිංගිරියේ සහ උතුරේ නව ආයෝජන කළාප ඇති කිරීමට අවශ්‍ය ඉඩම් වෙන් කිරීම
- උපාධිධාරී ගුරුවරුන් 2320කට පත්වීම් ලබාදීම
- ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳ මධ්‍යස්ථානය (රත්නපුර මැණික් කුළුන) විවෘත කිරීම
- උඩරට නැටුම් කලාව ආරක්ෂා කර ගනිමින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කිරීම
- කොම්පඤ්ඤවීදිය ද්විත්ව ගුවන් පාලම ජනතා අයිතියට පත් කිරීම
- ලෝකයේ අති නවීන තාක්ෂණික හා සංචාරක ක්‍රමවේදයක් සමඟින් "ශ්‍රී රාමායන් ට්‍රේල්ස්" දියත් කිරීම
- "උමා දිය ජනනි" බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය විවෘත කිරීම
- උමා ඔය ව්‍යාපෘතිය විවෘත කිරීමත් සමග ජාතික විදුලිබල පද්ධතියට ගිගා වොට් පැය 290 (290 GWh)ක විදුලි ධාරිතාවක්
- නව කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර් 4.500කට සහ පැරණි ඉඩම් හෙක්ටයාර් 1,500කට වාරි ජලය

- “උමා දිය ජනනි” ව්‍යාපෘතිය ආරම්භ කිරීම හරහා බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට ප්‍රදේශවල පානීය සහ කාර්මික ජල අවශ්‍යතා සැපිරීම
- දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා කොත්මලේ ප්‍රදේශයේ අක්කර 600ක් වෙන් කිරීම
- “පිකෝ ට්‍රේල්” ව්‍යාපෘතිය ආරම්භ කිරීම
- ඩොලර් මිලියන 6ක ඉන්දීය ප්‍රදානයක් යටතේ ස්ථාපිත ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) නිල වශයෙන් විවෘත කිරීම - (2024-06-20 ජනාධිපති කාර්යාලයේදී)
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට පත්කළ විනිසුරු චිත්‍රසිරි කමිටුව විසින් සකස්කළ පනත් කෙටුම්පත ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත බාර දී ඇත
- ඉරණවිල සංචාරක කලාපයක් ආරම්භ කිරීමට සැලසුම් කිරීම
- ගං වතුර පාලනය කිරීම සඳහා කැලණි ගං මිටියාවතේ නව ඉදිකිරීම් සඳහා අවසර නොදීමට සහ එම ප්‍රදේශ ආශ්‍රිතව අනවසර ගොඩකිරීම් සඳහා අවසර නොදීමට තීරණය කිරීම
- නව ග්‍රාම නිලධාරීන් 2,100කට පත්වීම් ලබාදීම
- ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ මූලස්ථාන සංකීර්ණය විවෘත කිරීම
- වෙළඳ කලාපයක් සහ ආයෝජන කලාපයක් ආරම්භ කිරීමට බිංගිරිය ප්‍රදේශයේ අක්කර දාහක් ලබා ගැනීම
- ප්‍රතිසංස්කරණය කළ රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කිරීම
- රසකැවිලි කර්මාන්තය ප්‍රමුඛ අපනයන ක්ෂේත්‍රයක් බවට පත් කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
- කිරි නිෂ්පාදනය ඇතුළු සත්ව කර්මාන්තය දියුණු කිරීමට පියවර ගැනීම
- රුපියල් මිලියන 55ක වියදමින් කරදියනාරු ප්‍රදේශයේ ඉදිකරන ලද රටකජු සැකසුම් මධ්‍යස්ථානය විවෘත කිරීම

## යටිතල පහසුකම් සංවර්ධනය

- විමධ්‍යගත අය වැය වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 11,250ක් වෙන් කිරීම
- මේ සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රුපියල් මිලියන 100 බැගින් ලබාදීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 25 ක් මූලික කරගෙන කෘෂි නවීකරණ කටයුතු ආරම්භ කිරීම
- “කඳුකර දශකය” වෙනුවෙන් රුපියල් බිලියන 10ක් වෙන් කිරීම
- අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු අදියර ජනතා අයිතියට පත් කිරීම
- කඳුකර දශකය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 89 ක් පුරා ගම්මාන දහස් ගණනක සංවර්ධන කටයුතු ආරම්භ කිරීම
- නෙදර්ලන්ත ජැන්සන් බ්‍රිජිං සමාගමේ අරමුදල් යටතේ (2014 - 2024) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ග්‍රාමීය පාලම් 750ක් සාර්ථකව නිම කිරීම

## ජන ජීවිතය නගා සිටුවීම හා සමාජ සුබ සාධනය

- ආර්ථිකය ස්ථාවර කිරීමේ වෑයමේ දී දිළිඳු හා අඩු වරප්‍රසාදිත කණ්ඩායම් රැක බලා ගැනීම සඳහා දැඩි අවධානයක් යොමුකිරීම
- රජයේ බලපත්‍ර ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබාදීම
- රජයේ තට්ටු නිවාසවල ජීවත්වන අයට නිවාස අයිතිය ලබාදීම.
- ආහාර නොමැති සියලු දෙනාට ආහාර ලබාදීම
- උරුමය ජාතික මෙහෙයුම් ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම
- උරුමය වැඩසටහනේ පළමු අදියරට අදාළව නිදහස් ඔප්පු 10,000ක් ගොවි ජනතාව වෙත ප්‍රදානය කිරීම
- නාගරික අඩු ආදායම්ලාභී නිවාස 50,000කට වැඩි ප්‍රමාණයක පූර්ණ අයිතිය ඒවායේ ජීවත් වන ජනතාවට ලබාදීම ආරම්භ කිරීම
- අඩු ආදායම්ලාභී ජනතාවට සහනයක් වශයෙන් එක් පවුලකට සහල් කිලෝ 20ක ප්‍රමාණයක් උත්සව සමය තුළ ලබාදීම
- අඩු ආදායම් ලබන පවුල් ලක්ෂ 24 කට අස්වැසුම ලබාදීම
- "අස්වැසුම" සඳහා රුපියල් බිලියන 183ක් වෙන් කිරීම
- "උරුමය" සින්නක්කර ඉඩම් ඔප්පු ලබාදීම වෙනුවෙන් රුපියල් බිලියන 02ක් වෙන් කිරීම
- කජීමාවත්තේ ගිනිබත් වූ නිවාස වෙනුවට රන්දිය උයනෙන් නිවාස 294ක් ලබාදීම
- අඩු ආදායම්ලාභී පවුල් පවුල් මිලියන 2.74ක් සඳහා සහල් බෙදාදීම
- වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා ඉහළ දැමීම
- සින්නක්කර ඔප්පු 1340ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බී, සී, මැදිරිගිරිය මොරගහගකන්ද යන මහවැලි කලාපවල ජනපදිකයන් වෙත බෙදා දීම
- "උරුමය" ජාතික වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17ක සුදුසුකම්ලාභීන් 20,000ක් අතුරින් පුද්ගලයන් 1,758ක් වෙනුවෙන් සංකේතාත්මකව ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම- 2024-05-25 අම්පාර වීරසිංහ ක්‍රීඩාංගණයේ දී
- මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉඩම් අයිතිය නොමැති පවුල් 27,595කට ඉඩම් ඔප්පු ලබාදීම සංකේතවත් කරමින් පවුල් 192ක් සඳහා ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම - (2024-06-22 මඩකලපුව, තිරයිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී)
- ඉන්දීය නිවාස ව්‍යාපෘතිය යටතේ මහනුවර, නුවරඑළිය සහ මාතලේ ප්‍රදේශවල ඉදිකෙරුණු නිවාස 106ක් ලබාදීම
- කොළඹ සහ ත්‍රිකුණාමලයේ ආදර්ශ ගම්මාන දෙකක ඉදිකරන ලද නිවාස 24 බැගින් ජනතාවට භාරදීම - (2024-06-20 ජනාධිපති කාර්යාලයේදී)
- "උරුමය" සින්නක්කර ඉඩම් ඔප්පු ලක්ෂ 20ක් ලබාදීමේ ජාතික වැඩසටහන යටතේ සුදුසුකම්ලත් මහවැලි වලව කලාපයේ ජනපදිකයන් 1,524 දෙනෙකු වෙත සින්නක්කර ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම (2024-06-17 ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගණයේදී)
- "උරුමය" සින්නක්කර ඉඩම් ඔප්පු ලක්ෂ 20ක් ලබාදීමේ ජාතික වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ ජනතාව වෙත ඉඩම් ඔප්පු 442ක් ප්‍රදානය කිරීම
- මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට පොහොර ලබාදීම වෙනුවෙන් මුදල් ලබාදීමට අදාළ චෙක්පත් ප්‍රදානය කිරීම
- අයහපත් කාළගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ මන්නාරම දිස්ත්‍රික්කයේ කෘෂි වගාවන් වෙනුවෙන් කෘෂි රක්ෂණ වන්දි ප්‍රදානය කිරීම සහ ප්‍රදේශයේ ධීවර ජනතාවට ධීවර ආම්පන්න මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම
- යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ම ආවරණය වන පරිදි උරුමය සින්නක්කර ඔප්පු 1,286ක් ජනතාවට ලබාදීම
- කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ආවරණය වන පරිදි සින්නක්කර ඔප්පු 1,700ක් ලබාදීම

- "උරුමය" වැඩසටහන යටතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04ක් හා මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක් ආවරණය වන පරිදි සින්නක්කර ඉඩම් ඔප්පු 700ක් ලබාදීම
- "උරුමය" සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව කෑගල්ල දිස්ත්‍රික්කයේ සින්නක්කර ඔප්පු 350ක් ප්‍රදානය කිරීම
- අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් කිලෝ 20ක් ලබාදීමේ වැඩසටහනේ දෙවන අදියර ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ පවුල් 800ක් සඳහා සහල් කිලෝ 10 බැගින් ලබාදීම
- මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාස 5ක් ආවරණය වන පරිදි සින්නක්කර ඔප්පු 600ක් ලබාදීම
- ආබාධිත වූ රණවිරුවන් වෙනුවෙන් විද්‍යුත් යතුරුපැදි ප්‍රදානය කිරීම
- අයහපත් කාලගුණයෙන් විපතට පත් ජනතාවට අඛණ්ඩව සහන සැලසීමට මිය ගිය එක් අයෙකු වෙනුවෙන් රුපියල් දෙලක්ෂ පනස්දහසක වන්දි මුදලක් පිරිනැමීම
- අයහපත් කාළගුණයෙන් ආපදාවට පත්වූවන්ට කඩිනම් සහන සැලසීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරු වෙත වහාම නිකුත් කිරීමට උපදෙස් ලබාදීම
- ආපදා තත්ත්වය හේතුවෙන් පූර්ණ හානියට පත් සියලු නිවාස රජයේ මුදලින්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ දායකත්වයෙන් ඉදිරි මාස 02 තුළ ඉදි කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් දීම
- ආපදා තත්ත්වයෙන් අවතැන්ව ආරක්ෂිත මධ්‍යස්ථානවල රැඳී සිටින ජනතාවගේ නිවාස සහ දේපළ ආරක්ෂා කිරීම වෙනුවෙන් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- ගංවතුරෙන් පීඩාවට පත් වූ සෑම නිවසකටම රුපියල් 10,000ක දීමනාවක් ලබාදීම

## පාරිසරික

- ශ්‍රී ලංකාව ගෝලීය තිරසාර ඉලක්ක සපුරා ගැනීම සඳහා පරිසර හිතකාමී පරිචයන් සහතික කරමින් ශුද්ධ ශුන්‍ය ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කිරීම
- ශ්‍රී ලංකා දේශගුණික සෞභාග්‍ය සැලැස්ම සකස් කිරීමේ අභියෝගාත්මක පියවර ගැනීම තුළින් දේශගුණික හා ජෛව විවිධත්ව ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකි වීම
- දේශගුණ විපර්යාස අවම කිරීමේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ කටයුතු සඳහා මුල පිරීම
- ආසියාවේ පළමු රට ලෙස ශ්‍රී ලංකාව කාබන් විමෝචනය ශුන්‍ය කිරීමේ ගෝලීය ඉලක්කය ජාතික ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම
- ජගත් පරිසර දිනය වෙනුවෙන් "ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය" එළිදැක්වීම
- දේශගුණික විපර්යාස පනත කෙටුම්පත් සකස් කිරීම
- රත්නපුර දිස්ත්‍රික්කයේ වර්ණගලවත්ත පරිසර ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමට අදාළ ගැසට් නිවේදනයට අත්සන් තැබීම

## නව තාක්ෂණික භාවිතාවන් සඳහා යොමුවීම

- ඩිජිටල් පරිවර්තන නියෝජිතායතනය සහ කෘතිම බුද්ධිය (AI) පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය එක්ව කටයුතු කිරීම
- පෞද්ගලික අංශය සමඟ එක්ව තවත් පුහුණු ආයතන ආරම්භ කිරීමටත්, කෘතිම බුද්ධිය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහාත් විශාල මුදලක් වෙන් කිරීම
- ජනාධිපති අරමුදලේ නව වෙබ් අඩවිය විවෘත කිරීම
- "ෆාම් ටු ගේට්" වෙබ් යෙදුම දියත් කිරීම
- කෘත්‍රිම බුද්ධි මධ්‍යස්ථානය නමින් වෙනම ස්වාධීන ආයතනයක් ඇති කිරීමේ පනත කෙටුම්පත් කිරීම
- කෘත්‍රිම බුද්ධිය (AI) ව්‍යාප්ත කිරීම සඳහා පාසල්වල කෘත්‍රිම බුද්ධි සමාජ (AI Societies) ආරම්භ කිරීම
- මාදම්පේ ප්‍රදේශයේ තොරතුරු තාක්ෂණ නගරයක් සැලසුම් කිරීම
- අන්තර්ජාලය වෙත යොමුකර ඇති හා සමාජ මාධ්‍ය ජාලා මඟින් හුවමාරුවන ළමයින්ගේ නිරුවත් ඡායාරූප හා අසභ්‍ය වීඩියෝ දර්ශන කඩිනමින් ඉවත් කිරීමේ මාර්ගගත ප්‍රවේශය

## අධ්‍යාපන

- දිවයිනේ අධ්‍යාපන කලාප 100ම ආවරණය වන පරිදි එක් කලාපයකින් සිසුන් 50ක් බැගින් තෝරාගෙන, සිසුන් 5,000ක් සඳහා මසකට රුපියල් 6,000 බැගින් වන ශිෂ්‍යත්ව ලබාදීම
- 2021 (2022) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස (සා.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිට විභාගය සමත්ව 2024 වර්ෂයේ දී අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ආර්ථික දුෂ්කරතා ඇති සිසුන්ට ජනාධිපති අරමුදල මඟින් පිරිනමන ශිෂ්‍යත්ව දීමනාව 2024 පෙබරවාරි මස සිට රුපියල් දහසකින් වැඩි කිරීම
- වසරකට පාසල් සිසුන් ලක්ෂයකට "ජනාධිපති ශිෂ්‍යත්ව" සඳහා රුපියල් මිලියන 3,600ක ප්‍රතිපාදන වෙන් කිරීම
- පාසැල් දරු දැරියන් ලක්ෂ 45 ක පමණ පිරිසකට සුරක්ෂා රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ ලබාදීම
- ජනාධිපති අරමුදල යටතේ පාසල් දරුවන් ලක්ෂයකට ශිෂ්‍යත්ව පිරිනැමීම
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාගැනීමේ පාසල් සංඛ්‍යාව 1,000 දක්වා වැඩි කිරීම. එමඟින් 2025 වසර වන විට අවම වශයෙන් සිසුන් 200,000ක් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබාගැනීමට පහසුකම් සැලසීම අපේක්ෂිතය
- මේ වසරේ සිට ක්‍රියාත්මකවන පරිදි, ජාතික විභාග ප්‍රතිඵල දක්වන සහතිකවලට සීමා නොවී පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතිකයක් (Certificate of Completion) සෑම සිසුවකුටම ලබාදීම
- 08 වන ශ්‍රේණියෙන් ඉහළ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ විෂය සමඟ කෘත්‍රිම බුද්ධිය (AI) හැදෑරීමට අවස්ථාව සලසා දෙමින් එහි නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ අවබෝධතා ගිවිසුමකට අධ්‍යාපන අමාත්‍යාංශය සහ මයික්‍රොසොෆ්ට් සමාගම අතර අත්සන් තැබීම
- පාසල් ආහාර වැඩසටහන ආරම්භ කිරීම
- පාසල් සිසුන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාදීම වෙනුවෙන් ලෝක ආහාර වැඩසටහන මඟින් ලැබුණු ආහාර ද්‍රව්‍ය බෙදාදීම
- පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා, සීලමාතාවන් හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් සහ අ.පො.ස (උසස් පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදලෙන් තවත් ශිෂ්‍යත්ව වැඩසටහන් දෙකක් ආරම්භ කිරීම
- මෙරට පාසල් සිසුන්ට "කේම්බ්‍රිජ් දේශගුණික ගවේෂණය" ස්වයං අධ්‍යයන පාඨමාලාව නොමිලේ හැදෑරීමට අවස්ථාව හිමි කර දෙමින් ශ්‍රී ලාංකීය සිසුන්ට ජාත්‍යන්තර මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම උදෙසා ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් ශ්‍රී ලංකාවට ලබාගැනීමට කටයුතු කිරීම

- පාසල් ගුරුවරුන්ගේ රුපියල් 2,500 කින් වැඩි වැඩිකළ දීමනාව ක්‍රියාත්මක කිරීම - (2024-06- 23 මඩකලපුව වෙන්කලඩි තරුණ හමුව)

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමධාරීන් 252 දෙනෙකුට ගුරු පත්වීම් ලබාදීම - (2024-06-22 මඩකලපුව, තිරයිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී)

- උසස් පෙළ සිසුන්ට සහ 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන් ලක්ෂයකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහන ආරම්භ කරමින් සංකේතාත්මකව සිසුන් 5108කට ශිෂ්‍යත්ව ප්‍රදානය කළ අතර එම අවස්ථාවේම හිඟ වාරික ද සමඟ ශිෂ්‍යත්ව මුදල් සිසුන්ගේ බැංකු ගිණුම්වලට බැර කිරීම (2024-06-19 ජනාධිපති ශිෂ්‍යත්ව ප්‍රදානය වෙනුවෙන් අරලියගහ මන්දිරයේ පැවති උත්සවය)

- පොදු ඉගෙනුම් අධ්‍යාපන වේදිකාව (Public Learn Education Platform) www.publiclearn.lk නිල වශයෙන් දියත් කිරීම

## බලශක්තිය

- 2030 වන විට ශ්‍රී ලංකාවේ විදුලි අවශ්‍යතාවයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීම සහතික කිරීම වෙනුවෙන් වන ක්‍රියාවලිය වේගවත් කිරීම

- අනාගතයේ විදුලි උත්පාදනය සඳහා පවතින පිරිවැය පිළිබිඹු කරමින් සෑම කාර්තුවකටම වරක් විදුලි ගාස්තු සංශෝධනය කිරීම

- ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණවලට අමතරව හරිත මූල්‍යකරණය ආකර්ෂණය කර ගැනීමේ රාමුව සකස් කිරීම

- විදුලිය උත්පාදනය සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය ලබාගැනීම සහ මෙම ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන හරහා පුද්ගලික අංශයේ සහභාගීත්වය සඳහා වැඩි අවස්ථාවක් සැලසීම

- 2026 වන විට මෙරට ජාතික විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීමේ අභිලාෂය වෙනුවෙන් 2030 දක්වා පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම

- මහා පරිමාණයේ සූර්ය හා සුළං බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම

- විදුලි බිලට සහනයක් ලබාදීම

- විදුලිබල ප්‍රතිසංස්කරණ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම.

- බලශක්ති පරිවර්තනය පිළිබඳ නීති සම්පාදනය කිරීම සඳහා අධ්‍යයනය

## සෞඛ්‍ය

- කඩිනම් වෛද්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රුපියල් බිලියන 30 ක අතිරේක ප්‍රතිපාදන ලබාදීම

- එක්සත් ජනපද ආහාර හා ඖෂධ පරිපාලනය (FDA) අනුමත වෙනත් රටවල ඖෂධ සහ නිර්දේශිත ඖෂධ මෙරටදී අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට උපදෙස් ලබාදීම

- රාගම ශික්ෂණ රෝහලේ දී සිදුකරන කුඩා දරුවන්ගේ අක්මා බද්ධ කිරීමේ ශල්‍යකර්ම සඳහා සහ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේදී දරුවන් වෙත සිදු කරන කර්ණශංඛ බද්ධ කිරීමේ ශල්‍යකර්මය සඳහා ජනාධිපති අරමුදලින් මූල්‍යාධාර ලබාදීම

- කරාපිටිය රෝහල ජාතික රෝහලක් බවට පත් කිරීමට අදාළ කැබිනට් අනුමැතිය හිමිවී ඇත

- ජනාධිපති අරමුදලෙන් රෝගීන්ට ලබා දෙන මුදල් දෙගුණ කිරීම

- නෙදර්ලන්ත රජයේ සහන ණය  යටතේ රුපියල් බිලියන 04ක වියදමින් පේදුරු තුඩුව මූලික රෝහල සංවර්ධනය කිරීම
- මෙරට වෛද්‍ය සහ හෙද අවශ්‍යතාවය සපුරාලීම සඳහා වාර්ෂික බඳවා ගැනීම් ඉහළ නැංවීම
- හරිත සරසවියේ  වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහලක් පවත්වාගෙන යාමේ අයිතිය ලබාදීම
- රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ "එම්. එච්. ඔමාර් විශේෂිත අක්මා රෝග ප්‍රතිකාර මධ්‍යස්ථානය" ස්ථාපිත කිරීම
- දකුණු ආසියාවේ විශාලතම මාතෘ රෝහල ගාල්ල කරාපිටියේ ස්ථාපිත කිරීම
- මන්නාරම මහ රෝහලට සී. ටී ස්කෑන් යන්ත්‍රයක් ලබාදීම (2024-06-16 මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති  මන්නාරම දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම)
- පළමු හෙද විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම
- යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඉදිකළ සායනික පුහුණු සහ පර්යේෂණ අංශ ගොඩනැගිල්ල විවෘත කිරීම (වසර 46 කට පසුව යාපනය විශ්වවිද්‍යාලයේ ඉදිකළ පළමු ගොඩනැගිල්ල වන අතර ඒ සඳහා රුපියල් මිලියන 942 ක් වැය කර තිබේ)
- කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ ඉදිකරන ලද කාන්තා සෞඛ්‍ය සේවා සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය (Centre of Excellence for Women's Healthcare) විවෘත කිරීම
- මාන්කුලම් මූලික රෝහලේවෛද්‍ය පුනරුත්ථාපන චිකිත්සාව සහ මානසික සෞඛ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම
- වව්නියාව දිස්ත්‍රික් මහ රෝහලේ නව හෘද රෝග හා වකුගඩු රෝග ඒකකය විවෘත කිරීම
- කිරිවත්තුඩුවේ "ගුරුදෙව් සුව අරණ ගිලන්  භික්ෂු මධ්‍යස්ථානය" (භික්ෂූන් වහන්සේ වෙනුවෙන් ඉදිකර තිබෙන පළමු රෝහල) විවෘත කිරීම
- ගුරුදෙව් සුව අරණ ගිලන්  භික්ෂු මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහාය ලබාදීම
- මුල්ලේරියාව සහ IDH රෝහල වෙනත් ස්ථානයකට ගෙන යාමට උපදෙස් දීම

## ආගමික

- ඓතිහාසික සිද්ධස්ථාන 11ක් පූජා භූමි ලෙස නම් කිරීම
- මුස්ලිම් ප්‍රජාව ඇතුළු ඕනෑම පුද්ගලයෙකුගේ අවසන් කටයුතු සිදු කිරීමේදී ආගමානුකූලව හෝ අවසන් කැමති පත්‍රයට අනුව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා නව කමිටුවක්
- මහා විහාර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට විශේෂ කමිටුවක් පත් කිරීම
- අනුරාධපුර ඓතිහාසික උරුමය සුරැකීමට ඊට ආවේණික නව නීති පද්ධතියක් සැකසීම
- පැරණි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය අනුවම කටයුතු පවත්වාගෙන යන, ගැඹුරින් ධර්මය අධ්‍යයනය කළ හැකි මධ්‍යස්ථානයක් ලෙස මහා විහාර විශ්වවිද්‍යාලය ඇති කිරීමේ කටයුතු ආරම්භ කෙරේ
- රුවන්වැලි සෑ පරිශ්‍රය කේන්ද්‍ර කරගෙන මහා විහාර පිරිවෙන් භූමියක් ස්ථාපිත කිරීම
- රජරට ශිෂ්ටාචාරය සහ බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳව ප්‍රදර්ශනාගාර ඇති කිරීම
- බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත සංශෝධනය කිරීම  සහ  ථේරවාදී භික්ෂු කතිකාවතක් ඇති කිරීමට අදාල පනත් කෙටුම්පත මල්වතු සහ අස්ගිරි මහා නාහිමිවරුන්ගේ අනුශාසනාව ලබා ගැනීම සඳහා පිළිගැන්වීම
- අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත ත්‍රිපිටක සංරක්ෂණ පනත් කෙටුම්පත සහ බෞද්ධ ප්‍රකාශන ග්‍රන්ථ නියාමන පනත සඳහා සංශෝධන සකස් කරන ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබාදීම

# උතුරු නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම

- දේශපාලන පක්ෂ නායකයන්ගෙන් සමන්විත ජාතික සභාවක් පිහිටුවීම
- විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික දෙමළ ජනතාව සමග සමීපව කටයුතු කරමින්, ශ්‍රී ලංකාව යළි නගාසිටුවීමේ වැඩපිළිවෙළට ඔවුන්ගේ සහාය ලබා ගැනීම
- කඳුකර දමිල ජනතාවගේ ගැටලු විසඳීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ත්‍රිකුණාමලය ආර්ථික කේන්ද්‍රස්ථානයක් ලෙස වර්ධනය කිරීමේ වැඩපිළිවෙළ ඉන්දියාව සමඟ ආරම්භ කිරීම
- "භාරත්-ලංකා" නිවාස ව්‍යාපෘතියේ සිවුවන අදියර ආරම්භ කිරීම
- නෙදර්ලන්ත රජයේ සහන ණය යටතේ රුපියල් බිලියන 04ක වියදමින් පේදුරු තුඩුව මූලික රෝහල සංවර්ධනය කිරීම
- මුස්ලිම් ප්‍රජාව ඇතුළු ඕනෑම පුද්ගලයෙකුගේ අවසන් කටයුතු සිදු කිරීමේදී ආගමානුකූලව හෝ අවසන් කැමති පත්‍රයට අනුව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා නව කමිටුවක්
- යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඉදිකළ සායනික පුහුණු සහ පර්යේෂණ අංශ ගොඩනැගිල්ල විවෘත කිරීම (වසර 46 කට පසුව යාපනය විශ්වවිද්‍යාලයේ ඉදිකළ පළමු ගොඩනැගිල්ල වන අතර ඒ සඳහා රුපියල් මිලියන 942 ක් වැය කර තිබේ)
- යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ම ආවරණය වන පරිදි උරුමය සින්නක්කර ඔප්පු 1,286ක් ජනතාවට ලබාදීම
- කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ ඉදිකරන ලද කාන්තා සෞඛ්‍ය සේවා සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය (Centre of Excellence for Women's Healthcare) විවෘත කිරීම
- කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ආවරණය වන පරිදි සින්නක්කර ඔප්පු 1,700ක් ලබාදීම
- මාන්කුලම් මූලික රෝහලේවෛද්‍ය පුනරුත්ථාපන චිකිත්සාව සහ මානසික සෞඛ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම
- යාපනය දිස්ත්‍රික්කය සඳහා නව ගුරු පත්වීම් 375ක් ලබා දීම
- මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාස 5ක් ආවරණය වන පරිදි සින්නක්කර ඔප්පු 600ක් ලබාදීම
- වව්නියාව දිස්ත්‍රික් මහ රෝහලේ නව හෘද රෝග හා වකුගඩු රෝග ඒකකය විවෘත කිරීම
- "උරුමය " වැඩසටහන යටතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04ක් හා මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක් ආවරණය වන පරිදි සින්නක්කර ඉඩම් ඔප්පු 700ක් ලබාදීම
- මඩු දේවස්ථානය සඳහා පැමිණෙන මාර්ගය දෙපස කඩිනමින් පිළිසකර කිරීමට යුද හමුදාවට උපදෙස් ලබාදීම
- මඩු වන්දනාකරුවන් යළි අත්අඩංගුවට පත්වුවහොත් වහාම ඒ පිළිබඳ ජනාධිපති කාර්යාලය දැනුවත් කරන ලෙසද දැනුම් දීම
- "උරුමය" සින්නක්කර ඉඩම් ඔප්පු ලක්ෂ 20ක් ලබාදීමේ ජාතික වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ ජනතාව වෙත ඉඩම් ඔප්පු 442ක් ප්‍රදානනය කිරීම
- මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට පොහොර ලබාදීම වෙනුවෙන් මුදල් ලබාදීමට අදාළ චෙක්පත් ප්‍රදානය කිරීම
- අයහපත් කාළගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ මන්නාරම දිස්ත්‍රික්කයේ කෘෂි වගාවන් වෙනුවෙන් කෘෂි රක්ෂණ වන්දි ප්‍රදානය කිරීම සහ ප්‍රදේශයේ ධීවර ජනතාවට ධීවර ආම්පන්න මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම
- මන්නාරම මහ රෝහලට සී. ටී ස්කෑන් යන්ත්‍රයක් ලබාදීම

  2024-06-16 මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති මන්නාරම දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම

- කොළඹ සහ ත්‍රිකුණාමලයේ ආදර්ශ ගම්මාන දෙකක ඉදිකරන ලද නිවාස 24 බැගින් ජනතාවට භාරදීම - 2024-06-20 ජනාධිපති කාර්යාලයේදී

- මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉඩම් අයිතිය නොමැති පවුල් 27,595කට ඉඩම් ඔප්පු ලබාදීම සංකේතවත් කරමින් පවුල් 192ක් සඳහා ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම - (2024-06-22 මඩකලපුව, තිරයිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී )
- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ආයතනයේ ඉංග්‍රීසි ඩිප්ලෝමධාරීන් 252 දෙනෙකුට ගුරු පත්වීම් ලබාදීම - (2024-06-22 මඩකලපුව, තිරයිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී)
- රුපියල් මිලියන 1,055ක වියදමින් මඩකලපුව තිරායිමඩු ප්‍රදේශයේ ඉදිකළ නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම - (2024-06-22 මඩකලපුව, තිරයිමඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේදී)
- රුපියල් මිලියන 55ක වියදමින් කරදියනාරු ප්‍රදේශයේ ඉදිකරන ලද රටකජු සැකසුම් මධ්‍යස්ථානය විවෘත කිරීම
- "උරුමය" ජාතික වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17ක සුදුසුකම්ලාභීන් 20,000ක් අතුරින් පුද්ගලයන් 1,758ක් වෙනුවෙන් සංකේතාත්මකව ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම- (2024-05-25 අම්පාර වීරසිංහ ක්‍රීඩාංගණයේ දී)
- ත්‍රිකුණාමලයේ තරුණ සේවා සභාවට අයත් අක්කර 200ක ඉඩමෙන් කොටසක් සංචාරක ව්‍යාපාරය සඳහා ලබාදී ඉතිරි කොටස ස්ථිර යොවුන් පුරයක් ඇති කිරීම වෙනුවෙන් ලබාදීම - (2024- 06- 25 අම්පාර වීරසිංහ ක්‍රීඩාංගනයේදී)

## ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සැලසුම්

- දමිළ ජනතාව කාලයක් තිස්සේ මුහුණදෙන ගැටළු සඳහා දේශපාලන විසඳුමක් ලබාදීම අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සලකා ඔවුන්ගේ නොවිසඳුන සමාජීය, ආර්ථික හා ඉඩම් ප්‍රශ්න විසඳීම සඳහා කඩිනම් පියවර ගැනීම.
- 21 සියවසට අවශ්‍ය සමාජ හා ආර්ථික වෙනස්කම් සලකා බලමින් උතුරේ හා නැගෙනහිර පළාත් වල සංවර්ධන කටයුතු පිළිබඳව අලුතෙන් සැලසුම් සකස් කිරීම.
- දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ආරම්භයක් ලෙස, 19 සංශෝධනයේ සියලුම සාධනීය අංගයන් ද අන්තර්ගත කොට 22 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම.
- උතුර නැගෙනහිර සංවර්ධන කටයුතු සඳහා ඩයස්පොරාවේ ආයෝජනත් වෙනත් විදේශ සමාගම්වල අයෝජනත් ලබා ගැනීමට කටයුතු කිරීම
- වී වගාවට අමතරව අනෙකුත් බෝග සඳහාද පොහොර ලබාදීම
- අපනයනය කේන්ද්‍රීය කරගත් තරගකාරී ආර්ථිකයක් ඇති කිරීම සඳහා තෝරා ගනු ලබන ප්‍රධාන පළාත් කිහිපය අතර උතුරු පළාත ඇතුළත් කිරීම
- උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකර්මයේ නවීකරණයක් ඇති කිරීම. ඒ අනුව ඉදිරි වසර 10 තුළ යාපනයේ High Technology" High Productive Agriculture ස්ථාපිත කිරීම
- ධීවර කර්මාන්තය වාණිජ වශයෙන් කරගෙන යා හැකි වැඩපිළිවෙළක් සකස් කිරීම
- තිබෙන බොටම් ට්‍රෝලින් ප්‍රශ්නය විසඳීම
- උතුරේ ජල ප්‍රශ්නයට විසඳුම් ලබාදීම
- මල්වතු ඔය සහ යෝධ ඇළ එක් කර ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම
- අනෙක් ගංගා සහ ඔය ආශ්‍රිතව ජලය ආරක්ෂා කරගැනීමේ වැඩසටහන් ආරම්භ කිරීම
- අලිමංකඩ කළපුවට පිරිසුදු ජලය ලබාදීම
- පූනරීන් වැව සංවර්ධනය කිරීම
- කෘෂිකර්මාන්තයට සහ සංචාරක ව්‍යාපාරයට අක්කර 4,000 පමණ ලබා ගැනීම
- වැව්වල සෝලා පැනල් සවිකර විදුලි බලය ලබා ගැනීම

- හරිත හයිඩ්‍රජන් නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම
- මන්නාරම සිට ත්‍රිකුණාමල දක්වා සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම
- මාන්කුලම, පරන්තන්, කන්කසන්තුරේ කර්මාන්ත කලාප ඇති කිරීම
- රාජ්‍ය නොවන  වෙනත් විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම
- පූනරින් නව නගරයක් බවට පත්කිරීම
- ඉන්දියාවේ සහාය ඇතිව ත්‍රිකුණාමලය වරාය සංවර්ධන වැඩසටහන
- පරිගණක අධ්‍යාපනය  වැඩිදියුණු කිරීම
- සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම සඳහා රෝහල් වැඩිදියුණු කිරීම

## ආර්ථික හා මූල්‍ය කළමනාකරණය, දූෂණය වංචාව පිටු දැකීම, සමාජ ආරක්ෂණය හා විවිධ ක්ෂේත්‍රයන්හි තිරසර සංවර්ධනය වෙනුවෙන්, පවතින නීති කෙටුම්පත්, අණ පනත් සංශෝධනය හා නව නීති කෙටුම්පත් ඉදිරිපත් කිරීම

පහත පරිදි අලුතින් නීති රීති සම්පාදනයට පියවර ගෙන ඇත. එනම්,

- කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභා පනත

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත**

මේ හරහා ප්‍රධාන වශයෙන් පහත විධි විධාන සැලසීමට යෝජිතය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවි බල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ කේන්ද්‍රස්ථානය පත් කිරීම සහ නම් කිරීම
- වෙනස් වූ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයක් සහිත තැනැත්තන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමානාත්මතාවය තහවුරු කිරීම ඒ හා සම්බන්ධ සහ එයට ආනුෂංගික කරුණු සඳහා ද විධි විධාන සැලැස් වීම

**කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත**

2024 අංක 37 දරණ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත 2024-07-02 දින සිට බලාත්මක කර ඇත. මෙම පනත ප්‍රධාන වශයෙන් පහත විධි විධාන සලසනු ඇත.

- කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම
- කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතිත ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම
- කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණ පිහිටු වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම

- ළමා ආරක්ෂණ පනත
- යොවුන් පාර්ලිමේන්තු පනත
- මත්ද්‍රව්‍ය මැඩලීමේ අණදෙන මූලස්ථාන පනත
- සත්‍ය සහ සංහිඳියා කොමිසම
- ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ ජාතික ආරක්ෂක පනත
- දැනට ක්‍රියාත්මක වන ප්‍රසිද්ධ රැඟුම් පාලක පනත අහෝසි කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රකාශන අයිතිය පදනම් කර ගනිමින් කලා නිර්මාණ වර්ගීකරණ පනත සකස් කිරීම

අප රට දේශගුණික විපර්යාසයන්ට බඳුන් වන කලාපයක පිහිටා තිබීම හේතුවෙන් දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම හරහා මෙරටට හරිත ප්‍රතිපාදන ලබා ගැනීමට ඉවහල් වන පරිදි පහත නීතින් හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

- දේශගුණික විපර්යාස පනත
- සමාජ සාධාරණත්ව කොමිෂන් සභා පනත
- ප්‍රතිවනරෝපණය සහ වෘක්ෂාවරණ පනත

- ජීවමාන පද්ධති පනත (මහවැලි ගඟ, සිංහරාජය, සිරිපාද අඩවිය හා වන ශිඛරය, හෝර්ටන් තැන්න, නකල්ස් කඳුවැටිය, ආදම්ගේ පාලම මීට අයත් වේ)

- සාගර සම්පත් ගවේෂණ සහ කළමනාකරණ නීතිය

- මුතුරාජවෙල සංරක්ෂණ පනත

**රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ යහපාලන මූලධර්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය නව නීති හඳුන්වා දෙමින් සිටිනවා. ඒ අතරින් පහත පනත් ප්‍රමුඛ වේ.**

- **ආර්ථික පරිවර්තන පනත**

  ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා විධිවිධාන සැලසීම සඳහා සහ ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ආයෝජන කලාප, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම සඳහා ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

  2024 වසරේ මැයි මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. සියලු පුරවැසියන්ට ප්‍රමාණවත් ජීවන මට්ටමක් අත් කරදීම, මුළු රටෙහිම සීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම, අනාගතයේ ආර්ථික අර්බුදයක් වළක්වා ගැනීම අරමුණු කරගෙන ඇත. ශ්‍රී ලංකාව ඉහළ තරඟකාරීත්වයෙන් යුතු අපනයන වෙත යොමු වීම සහ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්ථනය කිරීමේ ප්‍රතිපත්ති මෙමඟින් හඳුන්වාදීමට නියමිතය. ආයෝජන පහසු කිරීම, සෘජු විදේශ ආයෝජන හඳුන්වාදීම, ආයෝජන කලාප ඇති කිරීම, ආර්ථික කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම මේ යටතේ සිදුකෙරෙණු ඇත. ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ආයතනය සහ ශ්‍රී ලංකා ආයෝජන කලාප ආයතනය පිහිටුවීමට සැලසුම්කර ඇත.

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත**

  වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ව්‍යුහය තුළ රාජ්‍ය අරමුදල් පිළිබඳ වගවීම, අධීක්ෂණය, කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික වගකීම් පැහැදිලි කිරීම සඳහා ද, අයවැය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යසාධනය මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක්කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 8 වන හා 14 වන වගන්ති ඉවත් කිරීම සඳහා ද, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

  රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සියලු කරුණු ඇතුළත් නෛතික රාමුවකි. සෑම වසරකම ජුනි මාසයේදී මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්මක් මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය යටතේ ප්‍රකාශයට පත්කළ යුතුය. භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම සම්බන්ධයෙන් දැඩි මාර්ගෝපදේශ ඇතුළත් කර ඇති අතර සමස්ත ණය අඩු කිරීමේ සැලසුම යටතේ රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට පිළිබඳව අවධානය යොමුකර තිබේ.

- **රාජ්‍ය ණය කළමනාකරණ පනත**

  2024 අප්‍රේල් මාසයේදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. රජය වෙනුවෙන් ණය ගැනීම්, නිකුත් කිරීම් සහ රාජ්‍ය සේවාකරණය සඳහා බලය ලබාදීම සහ ඇපකර ගැනීම ඇතුළු රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා මෙය සකසා ඇත. මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීම පිළිබඳව සඳහන් කර ඇත. වාර්ෂික ණය ගැනීම් සැලසුම් කිරීම, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වන වෙන්දේසි දර්ශනයක් පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත්කිරීම කළ යුතුය. දේශිය සහ විදේශීය ණය ගැනීම්, ණය විධිවිධාන සැලසීම් පිළිබඳව ණය කළමනාකරණය කටයුතු පිළිබඳව වගකිව යුතුය.

- **රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත**

දූෂණය අවම කිරීම සඳහා රාජ්‍ය සම්පත් ඵලදායී අයුරින් කළමණාකරනය කිරීම පිණිස රාජ්‍ය වත්කම් කළමණාකරණය පිළිබඳ නව නීතී හඳුන්වාදීම සැලසුම් කර ඇත. ජාතික වත්කම් ලේඛණය සැකසීම සඳහා අවශ්‍ය නීතිමය පදනම මෙමගින් සපයනු ලබයි.

- **රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ නීතිය**

මීට අමතරව, පහත අණ පනත් හඳුන්වා දීමටද පියවර ගනු ලැබේ. එනම්,

- ආදායම් අධිකාරී පනත
- ආහාර සුරක්ෂිතතා පනත
- රාජ්‍ය දේපළ කළමනාකරණ පනත
- ආර්ථික ස්ථායීකරණ පනත
- ජාතික විශ්‍රාම දායකත්ව පනත
- නව සුරාබදු පනත
- විදේශ විනිමය පනතට ගෙන ආ සංශෝධන
- බුන්වත් පනත
- ඩිජිටල් තාක්ෂණ පනත
- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු පනත
- අන්‍යෝන්‍ය ඒකාග්‍රත්වය මත දික්කසාද වීමේ පනත

ආයෝජන හිතකාමී නෛතික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නව ආයෝජන නීතිය සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව නීතිය හඳුන්වා දීම ආරම්භ කර ඇත. ආර්ථික සංවර්ධනය සඳහා ඉඩම් උපරිම ප්‍රයෝජනයට ගැනීම සඳහා රජය විසින් නව ආයතනික වෙනස්කම් සමඟ නව ඉඩම් නීතියක් හඳුන්වා දෙනු ඇත.

ඉහත ගෙන හැර දැක්වූ නීතිවලට අමතරව රටේ ප්‍රගතියට අනුබල දීම සඳහා නව නීති ගණනාවක් හඳුන්වා දීම සහ පවතින යල් පැනපු නීතිවලට සංශෝධන ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර මේ අයුරින් නව නීති හා සංශෝධන නීති 60 ක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

# 2022.07.21 දින සිට මේ දක්වා පාර්ලිමේන්තුව තුළ සම්මත කරන ලද පනත්

| අනු අංකය | පනත |
|---|---|
| 1. | 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත |
| 2. | 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත |
| 3. | 2022 අංක 24 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත |
| 4. | 2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත |
| 5. | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත |
| 6. | 2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත |
| 7. | 2022 අංක 27 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) |
| 8. | 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත |
| 9. | 2022  අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත |
| 10. | 2022 අංක 29 දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත |
| 11. | 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත |
| 12. | 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත |
| 13. | විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය |
| 14. | 2022 අංක 37 දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත |
| 15. | 2022 අංක 35 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත |
| 16. | 2022 අංක 36 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත |
| 17. | 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත |
| 18. | 2022 අංක 33 දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනත |
| 19. | 2022 අංක 39 දරන ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත |
| 20. | 2022 අංක 40 දරන අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත |
| 21. | 2022 අංක 38 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත |
| 22. | 2022 අංක 41 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත |
| 23. | 2022 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනත |
| 24. | 2022 අංක 43 දරන විසර්ජන පනත |
| 25. | 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 26. | 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත |
| 27. | 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත |
| 28. | 2023 අංක 2 දරන පුනරුත්තාපන කාර්යාංශය පනත |
| 29. | 2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (සංශෝධන) පනත |
| 30. | 2023 අංක 31 දරන ගලහ හඳුවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන  භාරය පනත |
| 31. | 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත |
| 32. | 2023 අංක 8 දරන ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත |
| 33. | 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත |
| 34. | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත |
| 35. | 2023 අංක 13 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංශෝධනය කිරීමේ) (සංශෝධන) පනත |
| 36. | 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත |

| අනු අංකය | පනත |
|---|---|
| 37. | 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත |
| 38. | 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත |
| 39. | 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත |
| 40. | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත |
| 41. | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත |
| 42. | 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත |
| 43. | 2023 අංක 23 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත |
| 44. | 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත |
| 45. | 2023 අංක 24 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත |
| 46. | 2023 අංක 20 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත |
| 47. | 2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත |
| 48. | 2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශක නීතීඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත |
| 49. | 2023 අංක 28 දරන දූෂණ විරෝධී (සංශෝධන) පනත |
| 50. | 2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත |
| 51. | 2023 අංක 27 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත |
| 52. | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 53. | 2023 අංක 33 දරන මුදල් පනත |
| 54. | Appropriation ACT' No' 34 OF 2023 |
| 55. | 2024 අංක 4 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත |
| 56. | 2024 අංක 3 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත |
| 57. | 2024 අංක 2 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත |
| 58. | 2024 අංක 5 දරන සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත |
| 59. | 2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත |
| 60. | 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත |
| 61. | 2024 අංක 8 දරන අධිකරණයට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත |
| 62. | 2024 අංක 19 දරන භාර ලදුපත් (සංශෝධන) පනත |
| 63. | 2024 අංක 23 දරන සමාගම් (සංශෝධන) පනත |
| 64. | 2024 අංක 17 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත |
| 65. | 2024 අංක 21 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත |
| 66. | 2024 අංක 22 දරන දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත |

# පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්ථකයට ඇතුලත් කර ඇති හා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පනත් කෙටුම්පත්

| අනු අංකය | පනත |
|---|---|
| 1. | සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත |
| 2. | බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත් කෙටුම්පත |
| 3. | උකස් (සංශෝධන) පනත් කෙටුම්පත |
| 4. | ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත |
| 5. | ජාතික සමඟිය සහ ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත |
| 6. | නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත |
| 7. | දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත |
| 8. | බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත |
| 9. | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත |
| 10. | බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත |
| 11. | ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත |
| 12. | ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතට අදාළ අධිකරණ තීන්දුව |
| 13. | යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත |
| 14. | ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත |
| 15. | රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත |
| 16. | සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත |
| 17. | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත |